# 1. අපගේ දෙවියනි

සර්ව බලධාරී යා අල්ලාහ්
සැම දා අප හැම රැක දෙන්නේ
සත් ගුණයෙන් පිරි ජීවිතයක්
දෙනු මැන අපහට යා අල්ලාහ්

නැණ බලයෙන් අප වඩවන්නේ
ආලෝකය සිත පුරවන්නේ
සිඳු දරුවන් අප සනසන්නේ
නමදිමු ඔබ අප රැක ගන්නේ



කරුණා දයාව පෙන්වන්නේ
අඩුවක් නැත එහි සිදු වන්නේ
අපගේ දුක හැම දුරු කරලා
පිහිටක් වනු මැන යා අල්ලාහ්

පුංචි අපේ සිත් සනසාලා
ඊමානයෙන් සිත පුරවාලා
යහමඟ පතමින් නමදින්නේ
පිහිටක් වනු මැන යා අල්ලාහ්

## පැවරුම්

පහත දී ඇති වචන යොදා හිස්තැන් පුරවා අභ්‍යාස පොතේ ලියන්න.

නමදිමු, කරුණාවන්ත, සර්වබලධාරී, අල්ලාහ්, දුකේ දී

1. අපි .................. ගෙන් පමණක් ප්‍රාර්ථනා කරමු.
2. අල්ලාහ් .......................... ය.
3. අපි අල්ලාහ්ට පමණක් ..................
4. අල්ලාහ් අසීමිත .................... යා ය.
5. අපට .................... පිහිට වන්නා, අල්ලාහ් ය.